# ලංකා ඉතිහාසය

## 6.3.2 කෝට්ටේ රාජධානියේ විශිෂ්ට රජවරුන්



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education


## හයවෙනි පරාක්‍රමබාහු රජතුමා
## (ක්‍රි.ව 1412-1467)

කෝට්ටේ රාජධානිය හයවෙනි පරාක්‍රමබාහු රජතුමාගෙන් ආරම්භ වේ. දොන් ජුවන් ධර්මපාල රජතුමාගෙන් අවසාන වේ.(1597)

මේ කාල වකවානුව තුළ රජවරුන් ගණනාවක් පාලනය ගෙන ගිය ද , විශිෂ්ටතම පාලකයා වන්නේ VI වෙනි පරාක්‍රමබාහු රජතුමා ය. එමනිසා මෙම ඒකකයේ දී VI වෙනි පරාක්‍රමබාහු රජ්‍ය කාලය පිළිබඳ හැදෑරීම සුවිශේෂී වේ.


VI වෙනි පරාක්‍රමබාහු රජතුමා පිළිබඳ හැදෑරීමට උපකාරවන ප්‍රධාන මූලාශ්‍ර 2 කි.

- සාහිත්‍ය මූලාශ්‍ර
- පුරා විද්‍යාත්මක මූලාශ්‍ර




අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk




රජුගේ ළමා කාලය, රාජ්‍ය පදවි ප්‍රාප්තිය හා රජකමට වූ උරුමය පිළිබඳ විවිධ ජනප්‍රවාද පසුකාලීන ලේඛකයන්ගේ කෘතිවලට ඇතුළත්ව ඇත.

## පැරකුම්බා සිරිතට අනුව

"මෙලෙස තෙදබල මහත් අණසක ඇති රජුන් තුල පිවිතුරු .
සවුළු විජයබා නිරිඳු පින් පැරකුම් හට මුණුබුරු
ලමැණි ජයමහාලැණ හිමි සුරතුර වෙලු රන් ලිය යුරු
සුනෙත් මහදෙවි බිසෝහිමි ලත් රජ රුවක් සොඳ බුදුකුරු"
( පැර . 27 කව.)

පැරකුම්බා සිරිතට අනුව එතුමාගේ පියා ගම්පොළ රජ කළ පස්වැනි පරාක්‍රමබාහුගේ මුණුබුරෙකු වූ ළමැණි ජයමහලැණි (ජයපාල මහීපති ) නැමැත්තෙකි. මව සුනේත්‍රා දේවිය යි.

හයවෙනි පැරකුම්බා සමයේ දී ශ්‍රී ලංකාවට පැමිණි බෙංගාල සංස්කෘත ලේඛකයකු වූ **ශ්‍රී රාමචන්ද්‍ර භාරතී** ද මේ බව සනාථ කොට ඇත.මේ තොරතුරු පිළිබඳ දීර්ඝ විමර්ශනයක යෙදෙන පරණවිතාන මහතා මේ නිගමනවලට එළඹෙයි.

එහි දී ඔහුගේ පරපුර මෙසේ දක්වයි.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

V සවුළු විජයබාහු + සුමිත්‍රා දේවි
↓
V පරාක්‍රමබාහු + විහාරදේවි
↓
ජයමහලැණ + දූ කුමරිය
↓
ළමැනි ජයමහලැණ + සුනේත්‍රා දේවි
↓
VI වැනි පරාක්‍රමබාහු + කීර වැල්ලේ කුමරිය
↓
උලකුඩය දේවිය + නන්නූර් තුනයාර්
↓
II ජයබාහු

## පැරකුම් කුමරුගේ ළමා අවධිය

රාජාවලියේ සඳහන් අන්දමට ගම්පොළ යුගයේ ශ්‍රී ලංකාවට ආක්‍රමණය කළ චෙංහෝ සෙන්පතියා විසින් වීර අලකේශ්වර හා ඔහුගේ නෑයන් චීනයට රැගෙන ගිය අවස්ථාවේ සිටි සුළු පිරිසට ජයමහලැණ ද අයත් වී ඇත. පසුව පරාක්‍රමබාහු කුමරු සිය මව සමඟින් ප්‍රදේශාධිපතියකුගේ රැකවරණය යටතේ වාසය කොට ඇත.

vi වෙනි පැරුකුම් කුමරු හා ඔහුගේ සොහොයුරා පොල්වත්ත ගමේ රහසේ ඇති දැඩි වුන බව රාජාවලිය පවසයි. ගල්බඩකෝරලයේ පොල්වත්ත ගමේ, vi වෙනි පැරුකුම් කුමරු සැඟවී සිටීම ගැන ජනප්‍රවාද අදත් ඇතැ යි බෙල් පවසයි.(Kegalle Report-p-5)

අලකේශ්වර පවුලේ බලය වීනුන් නිසා විනාශ වීම සමඟ යළිත් දැදිගම v පරාක්‍රමබාහු රජුගේ පරපුර ඉදිරියට ආවේ ය. රාජාවලියට අනුව vi වැනි පැරකුම් කුමරු සොළොස් හැවිරිදි වූ කල විසිදාගම හිමි ප්‍රධානින් ගෙන්වා කතා කර ගෙන අලකේශ්වරට රහසින් වෙසඟ දිනක කුමරු සේනාවට භාර දී අලකේශ්වරට හදි කරවා පරාක්‍රමබාහු නමින් රජ කරවිය. (රාජා -75 පිට)

චීන සෙන්පතියා විසින් පරාක්‍රමබාහු කුමරු ද චීනයට රැගෙන යන ලද බවත් පසුව අධිරාජයා විසින් කුමරුට අභයදානය දී ලංකාවට එවා රජ කරවන ලද බවත් පෘතුගීසි ඉතිහාසඥයකු වූ දියොගු කුතෝ සඳහන් කර ඇත.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

# 6 වෙනි පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලන වැදගත්කම

- පොලොන්නරුවේ රජ කළ I වැනි පරාක්‍රමබාහු රජුගෙන් පසු ලංකාව එක්සේසත් කිරීමට සමත්වීම, එම එක්සත්භාවය පවත්වා ගෙන යාම.

**ලංකාව එක්සේසත් කිරීම හා එක්සත්භාවය පවත්වා ගෙනයාමට එතුමා අනුගමනය කළ ක්‍රියාමාර්ග පහත ආකාරයට ගොනු කළ හැකි වේ.**

1) * මේ කාලය වනවිට සමාන්තර බල වර්ධනයක් ඇති කරගෙන සිටි දැදිගම පරාක්‍රමබාහු රජු අවනත කර ගැනීමට කටයුතු කිරීම.

> - අන්තිමේ ඔහු දැදිගම රජුගේ මිනිසුන් තම පිලට හරවා ගෙන දැදිගම පැරකුම් රජු මැරවීය. ප්‍රාචීණ භාෂාපකාර සංගම් ශාස්ත්‍රිය සංග්‍රහය (56 පිටුව)

*බුදු දහමට විශාල අනුග්‍රහයක් දක්වමින් භික්ෂූන් වහන්සේලාගේ සිත් දිනාගෙන ජනප්‍රිය පාලකයකු බවට පත්වීමට උත්සුක වීම. මේ අනුව දැදිගම නැවතී සිටි මහතෙරුන් වහන්සේලා කෝට්ටේ හා ඒ අවට ප්‍රදේශවලට පැමිණ පදිංචි වීම.

* දැදිගම පරාක්‍රමබාහු රජු හයවැනි පරාක්‍රමබාහු රජුගේ යුවරජු ලෙස කටයුතු කොට ඇති බව පරෙවි සංදේශ තොරතුරුවලින් පැහැදිලි වීම. මේ මඟින් දැදිගම ඇතුළු සතර කෝරලය හා උඩරට ප්‍රදේශවල බලය පැතිරවීමට රජුට හැකිවීම.

> - ක්‍රි.ව 1415 උඩරට , 6 වැනි පැරකුම්ට යටත් වූ බව 6 පරාක්‍රමබාහු රජුගේ ගඩලාදෙනිය ශිලා ලිපියෙන් පෙනෙයි. (E: Z iv p. p 16-27)

02) * වියළි කලාපයේ හා රුහුණු රටේ පැවති ස්වාධීන පාලන ඒකක හා වන්නි ජනපදවල විසූ වන්නියාර්වරු අවනත කිරීම. වන්නි නායකයන් 18 ක් අවනත කළ බව ගිරා සංදේශයේ සඳහන් වීම.

> තෙවිකුම් විකුම් ඇති - අපහිමි දිනිඳු කුලපති
> පෙර නිරිඳුන් අයිති - නුවු දසටක් වන්නි ජයගති
> (ගිරා 137 කව)


Copyright © www.e-thaksalawa.moe.gov.lk

උඩරට රාජ්‍යය යටත් කර ගැනීමෙන් පසු රජුගේ වැදගත් කාර්ය වන්නි ජය ගැනීම විය හැක.

වන්නි ජයගැනිම- පැරකුම්බා සිරිත

දුල යස පැරකුම් රජ දඹදෙනි වැසි
කුල වන්නින් මැඩැ තෙද බලයෙන් නිසි
නිල ලා සිරිලක තැන්පත් කළ ලෙසි
කැළඹූ දිය පැදු වැනි අග තිසි
(පැර-46)

**වන්නියාර්**

මෙවක යාපනයට දකුණින් පිහිටි කැළෑබද වන්නි ජනපදවල සිටි ඇතැම් සිංහල හා දෙමළ වන්නි නායකවරුන් යාපන පාලකයා වූ ආර්ය චක්‍රවර්තිට පක්ෂව සිටි බව යාල්පාන වෛපමාලෙය ග්‍රන්ථයේ සඳහන් වේ. මේ වන්නි ජනපදවල පාලකයෝ වන්නියාර් නමින් හඳුන්වා ඇත.

03) සපුමල් කුමරු ප්‍රමුඛ සේනාවක් යවා උතුරේ ආර්ය චක්‍රවර්තීන් යටතේ පැවති යාපන රාජ්‍යය අත්පත් කර ගැනීම.

යාපා පටුන ජයගැනීම සිද්ධිය සාහිත්‍ය කෘති ගණනාවක සඳහන් වේ.

රාජාවලිය (75,76 පිටු)
අලකේශ්වර යුද්ධය (23-24 පිටු)
සැළලිහිණි සංදේශය (29 කව)
ගිරා සංදේශය (145, 147 කව)
පැරකුම්බා සිරිත (52 කව)
කෝකිල සංදේශය (258,289 කව)
යාල්පාන වෛපමාලෙයි-යාපා පටුනේ වංශ කතාව (5 පරි-24,25 පිටු)
වැලංටයින් , කුටෝ වාර්තා



අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- සපුමල් කුමරු ප්‍රමුඛ සේනාව යාපා පටුන ජය ගැනීම පිළිබඳව කෝකිල සංදේශය

| | |
|---|---|
| සුරිය සඳිසි තද තෙද එරද | හැම වර |
| වීරියපසිඳු වත දස අට | නොහැර |
| කාරිය සිතට නොමගෙන දුක් | පතර |
| ආරිය සක්විතිහු ගියෙ රට හැර | එතෙර |
| | (කෝකිල-265 කව) |

- සැළලිහිණිය - යාපා පටුන දිනා එන සපුමල් කුමරු වර්ණනාව

| | |
|---|---|
| නිල තුරඟට නැඟෙමින් රිවි දෙව් | සිරිත |
| දුලකරමිණි සේසත් බරණ | කිරණින |
| බල පිරිසෙන් සහ යාපා පටුන් | ගෙන |
| බල සේනානායක සපුමල් කුමරු | එන |
| (සැළ-29 කව) | |

* යාපා පටුන ජය ගැනීමෙන් පසු සිංහරූපය හා " ශ්‍රී පරාක්‍රමබාහු " නම සහිත විශේෂ කාසියක් රජු නිකුත් කළේය. (ලංකාවේ මිළ මුදල් 20 පිට)

- යාපා පටුන පැරදවීම- ගිරා සංදේශය

| | | |
|---|---|---|
| "මෙ ලක නිරිඳුන් හට | - | අවනත නොවූ පෙර සිට |
| ආරිය සක්විතිට | - | නොමඳ බලසෙන් යවා යුදයට |
| කළයුදෙහි රිදවා | - | එනිරිඳු ලුහු බඳවා |
| ඔහුගේ ඔද සිඳුවා | - | මයිල් නා බෑ මලුන් බඳවා" |
| | | (ගිරා 145-146 කව) |

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

4) උඩරට ජෝතිය සිටු ඇති කළ කැරැල්ල අම්බුලුගල කුමරු යවා මර්දනය කිරීම.

"හයවෙනි පැරකුම් රජුගේ අවසානය දක්වා අභ්‍යන්තර කැරලි නොවුවත් රජුගේ 52 වැන්නේ උඩරට සොජාත සිටු වැඩට එවන මිනිසුන් නොඑවා අංගම්පොර ඇර අයබදු නොඑවා සිටියේ ය."
(රාජා - 76 පිට)

( මෙහි සොජාතා ලෙස හඳුන්වා ඇත්තේ ජෝතිය.)

ජෝතියගේ කැරැල්ල ගැන ඇසූ රජු අම්බුලුගල කුඩා කුමරු යටතේ සේනාව යවන ලදුව අම්බුලුගල කුමරු උඩරට ජයගෙන ජෝතියගේ නෑදෑයන් අල්ලා සිරකොට කෝට්ටේට එවීය.
(රාජා -77 පිට)

05) උඩරට බලය ලබාගෙන සිටි වික්‍රමබාහු සාමන්තයාගේ අවනතභාවය ලබාගැනීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## විදේශීය යුද්ධ ජයග්‍රහණය

1) දකුණු ඉන්දියාවේ අදිවිරරාම පටුනට ආක්‍රමණයක් දියත් කිරීම.




Vi වැනි පැරකුම් රජු වෙළෙඳාමට සම්බාධක යැවූ බඩු අයපට්ටනමේ විරරාම නැමැති මලවරයා නැව සමග ම උදුරා ගත් බව ඇසූ සිංහල රජු ඔහුට පහරදීමට නැව් සිය ගණනක් යැවීය. මේ සිංහල හමුදාව මාල වරායට පහරදීමට හේතු වූයේ වෙළෙඳ නැව කොල්ල කෑම බව රාජාවලිය (76 පිට)හා අලකේශ්වර යුද්ධය (22 පිට) කියයි.

යාපනය ජය ගැනීමට සුළු කලකට පසු කළ මේ සටන දකුණු ඉන්දියාවේ නැව් තොටකට විරුද්ධව එකකි. මාලවරායර හෙවත් ‘වරුකුරුඩ උදයන්’යන ප්‍රධානියා සිංහල රජුගේ වෙළෙඳ නැවක් කොල්ල කෑම නිසා අදිවිරරාම පටුනට (ආදියම්පට ) හමුදාවක් යවන ලදි. ඒ ස්ථානය අල්ලා ගන්නා ලදී. (C. H. cp 312.)

2) විජයනගර් අධිරාජයාගේ තොටුපළ ආක්‍රමණය කිරීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සංස්කෘතික දියුණුව

- පැරණි පූජාස්ථාන දියුණු කිරීමට කටයුතු කිරීම
- බෞද්ධ සිද්ධස්ථාන නගා සිටුවීම



ශ්‍රී පාදස්ථානය



කැලණි විහාරය



ලංකාතිලකය



මහියංගනය



අත්තනගලු විහාරය



ගඩලාදෙණිය

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- දළදා වහන්සේ සඳහා දළදා මාලිගාවක් කරවීම- චූලවංශය (92:17)

සිය මැණියන් නමින් පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන කරවා එහි නඩත්තුවට ගම්වර පූජා කළ බව - පැපිලියාන සන්නසේ සඳහන් වීම.

VI වැනි පැරකුම් රජ තම මැණියන් නමින් පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන හා සංඝරාමයක් ද කරවා ගම්බිම් පුදා තුන්රට පිදූ බවත් එහි දන්වැට තැබවූ බවත් - චූලවංශය(91: 24-26 )

අටුවා ටීකා සහිත පිටක ත්‍රය ලිය වූ රජු බණ පොත් ලියන ලිපිකරුවන්ට ගම්බිම් පිදූ බව චූලවංශය (91:29)

- **පිරිවෙන් රාශියක් දියුණුවට පත්ව තිබීම**

උදා :- පැපිලියානේ සුනේත්‍රාදේවි
විදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන
තොටගමුවේ විජයබා පිරිවෙන
දෙවිනුවර ඉරුගල්කුලතිලක පිරිවෙන
කැරගල පද්මාවතී පිරිවෙන

- **උගත් පඬිවරුන් විශාල පිරිසක් සිටීම**

උදා :- තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
වෑත්තෑවේ හිමි
කැරගල වනරතන හිමි
අලගියවන්න මුකවෑටිතුමා

- රජු මෙන් ම ඇමතිවරු ද ග්‍රන්ථකරණයේ නියැලීම.

VI වෙනි පැරකුම් රජ වෙහෙර විහාර රැසක් ප්‍රතිසංස්කරණය කළේ ය
චෛත්‍ය රැසක නවතම හුණුකම් කරවී යැයි චූල වංශය කියයි.

- මහියංගනය දාගැබ ප්‍රතිසංස්කරණය කළ බව සුළු රාජාවලිය (31 පිට)
- ගඩලාදෙණිය, ලංකාතිලකය විහාරවල රජු සුණුකම් කරවිය.(චූ.ව. 91)සුළු රාජාවලිය (31 පිට)
- රුවන්වැලිසෑයේ රන් ආලේප කළ බව සෙල්ලිපිවල එයි.

- ශ්‍රී රාමචන්ද්‍ර භාරති වැනි උගත් පඬිවරුන් ලංකාවට පැමිණීම මේ රජතුමා කාලයේ සිදුවිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk